[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

## මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 06 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ........................................................................

### I කොටස

**අංක 01 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) මිනිසා විසින් පළමුවරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි හමුවී ඇති රට කුමක්ද?
   1) ඉරාකය 2) ඊශ්‍රායලය 3) චීනය 4) අරාබිය

2) මුහුණුවල දක්නට තිබෙන වෙනස්කම් අනුව අප්‍රිකානු ප්‍රදේශවල ජීවත්වන ජනවර්ගය පහත පිළිතුරු අතරින් තෝරන්න.
   1) නීග්‍රොයිඩ් 2) මොන්ගොලොයිඩ්
   3) ඔස්ට්‍රලොයිඩ් 4) කොකසොයිඩ්

3) වෘත්තයට අංශක 360 ක් ඇතිබව ලෝකයට ප්‍රථම වරට ප්‍රකාශ කළේ කුමන ශිෂ්ටාචාරය ද?
   1) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය 3) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය
   2) ඊජිප්තු ශිෂ්ටාචාරය 4) චීන ශිෂ්ටාචාරය

4) ලෝකයේ පැරණිතම නීති පොත රචනා කර ඇත්තේ,
   1) ගිල්ගමේෂ් විසිනි 2) හමුරාබි විසිනි
   3) පාරාවෝ රජදරුවන් විසිනි 4) අක්හෙනතන් රජු විසිනි

5) මිනිසකු වීමට නැඹුරු වූ පැරණිතම වානරයා,
   1) ඔස්ට්‍රලෝපිතිකස් ය 3) හෝමෝඉරෙක්ටස් ය
   2) හෝමෝහැබිලස් ය 4) හෝමෝසාපියන් ය

6) අප ආහාරයට ගන්නා වී මුල්වරට වගා කරන ලද්දේ මින් කුමන ප්‍රදේශයක ද?
   1) මධ්‍යධරණී ප්‍රදේශයේ 2) චීනයේ
   3) මධ්‍යම මෙක්සිකෝවේ 4) කැනඩාවේ

7) ක්‍රි.පූ.3000 ට අයත් වූ මැටියෙන් තැනූ දැකැත්තක් භාවිතා කරන ලද්දේ කුමන යුගයක දී ද ?
   1) පුරාශිලා යුගය 2) නවශිලා යුගය
   3) මධ්‍යශිලා යුගය 4) වර්තමාන යුගය

8) ශිෂ්ටාචාර ආරම්භවීමට පෙර සමාජය තුළ දුප්පත් හා පොහොසත් වශයෙන් දෙපිරිසක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
   1) අධ්‍යාපන මට්ටමේ ඇතිවූ වෙනස්කම් නිසා ය
   2) ඉදිකරගත් නිවාසවල තිබූ විශාලත්වය මතය
   3) අනුගමනය කළ සිරිත් විරිත් නිසා ය
   4) අස්වැන්න ලබා ගැනීමේ තිබූ වෙනස්කම් නිසා ය

9) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය සිදුවීමට පෙර කාලය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   1) ක්‍රිස්තු පූර්ව නමිනි 2) ක්‍රිස්තු වර්ෂ නමිනි
   3) බුද්ධ වර්ෂ නමිනි 4) ශක වර්ෂ නමිනි

10) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා ඇති ගංගා නිම්න දෙක වන්නේ,
   1) ඉන්දු ගඟ හා ගංගා නම් ගඟ 2) හොවැංහෝ ගඟ හා යැංසි ගඟ
   3) යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා 4) නයිල් ගඟ හා ක්‍රිෂ්ණා ගඟ

11) විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද තැන ලෙස සැලකෙන්නේ,

1) මාතොට 2) තම්බපණ්ණිය
3) ත්‍රිකුණාමලය 4) ගොඩවාය

12) පහත (A) තීරයේ දැක්වෙන ස්මාරක අපට හමුවන ශිෂ්ටාචාරයන් (B) තීරයේ දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| (I) සෙල්ලම් මැටි කරත්තය | (a) ඊජිප්තුව |
| (II) පිරමීඩ | (b) මෙසපොතේමියාව |
| (III) කූනාය අක්ෂර | (c) ඉන්දු නිම්න |

1) a,b,c 2) c,b,a 3) b,a,c 4) c,a,b

13) මමීකරණය ලොවට දායාද කරන ලද්දේ ,

1) ඊජිප්තු වැසියන් විසිනි 2) මෙසපොතේමියානුවන් විසිනි
3) ඉන්දු නිම්න වැසියන් විසිනි 4) රෝම වැසියන් විසිනි

14) ගල් යුගයේ මිනිසුන් විසින් සිදු **නොකරන ලද** කාර්යයක් වූයේ,

1) කැලයේ වෙසෙන සතුන් දඩයම් කිරීම
2) ගල් මෙවලම් වැඩිපුර භාවිත කිරීම
3) මියගිය තම නෑදෑයන් සඳහා අවමංගල චාරිත්‍ර ඉටු කිරීම
4) වී වගා කොට බත් ආහාරයට ගැනීම

15) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයක් **නොවන්නේ**,

1) ගීසා 2) මොහෙන්ජෝදාරෝ
3) හරප්පා 4) ඩොලවීර

16) • දීඝ ගාමිණී කුමරු හා චිත්‍රා කුමරිය පියා සහ මව විය.
• පණ්ඩුල නම් බ්‍රාහ්මණයකුගෙන් අධ්‍යාපනය ලැබීය.
• ප්‍රථම වරට අනුරාධපුරය අගනගරය කර ගනිමින් රජ බවට පත්විය.

ඉහත විස්තරය මඟින් කියැවෙන රජතුමා කවුරුන් ද?

1) දේවානම්පියතිස්ස රජතුමා 2) පණ්ඩුකාභය රජතුමා
3) දුටුගැමුණු රජතුමා 4) වලගම්බා රජතුමා

17) මෙරට වාසය කළ යක්ෂ ගෝත්‍රික කණ්ඩායම්වලට අයත් නගරයක් වන්නේ මින් කුමක්ද?

1) අනුරාධපුරය 2) ලංකාපුරය
3) මාගම 4) ලංකා පටුන

18) විජය කුමරු සමඟ ලංකාවට පැමිණි පිරිස ගම්මාන පිහිටුවාගත් ගංගා නිම්නය කුමක් ද?

1) මල්වතු ඔය 3) කලු ගඟ
2) මහවැලි ගඟ 4) කැළණි ගඟ

19) පහත A හා B අතර ඇති සම්බන්ධය ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| I. කයිරෝ නගරය | A දෙවියන්ට පුද පූජා පැවැත්වූ දේවාල |
| II.සිගුරට් | B නයිල් ගංගා නිම්නය |
| III.ඊජිප්තුව | C වෙළඳාමේ දක්ෂයන්ය |
| IV.ඇසිරියන්වරු | D ගීසා පිරමීඩ |

1) DCBA 2) DABC
3) BACD 4) BCDA

20) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන ගංගාවකි,

1) නයිල් ගඟ 2) හොවැංහෝ ගඟ
3) ඉන්දු ගඟ 4) යුප්‍රටීස් ගංගාව

**(ලකුණු 2× 20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01). A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1) මෙම නිර්මාණයෙන් දැක්වෙන්නේ කවුරුන් ද ?
2) ඇය කුමන රජ කෙනෙකුගේ බිසවක් ද ?
3) ඇය විසින් පාලනය කළ රට කුමක්ද?
4) මොවුන් අයත් රජ පෙළපත හැඳින් වූ නම කුමක්ද ?



1) මෙහි දැක්වෙන නිර්මාණය හඳුනා ගෙන නම් කරන්න .
2) කුමන යුගයකට මෙය අයත් වේ ද?
3) මෙය නිර්මාණය කිරීමට යොදා ගත්තේ කුමක් ද ?
4) මේ අවධියේ මිනිසුන් සතු වූ වෙනත් සෞන්දර්යාත්මක හැකියා මොනවාද ?

**(ලකුණු2 X 8 = 16)**

02)

1. ඔබේ පාසලේ ඉතිහාසය හැදැරීමේ දී උපකාරී වූ සාහිත්‍යමය මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)
2. ඉතිහාසය පිළිබඳව තොරතුරු සෙවීමේදී වැදගත් වන පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න . (ලකුණු 04)
3. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

03)

1. මහා හිම යුගයේ මානවයා මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් සඳහන් කරන්න. (ලකුණු 02)
2. හෝමෝ නියැන්ඩතාලෙන්සිස් මානවයා සතු වූ හැකියාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)
3. පුරාශිලා යුගයේ මිනිසුන් ජීවත් වූ ආකාරය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04)

1. නව ශිලා යුගයේ මිනිසුන් ගොවිතැන් කළ ධාන්‍ය වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
2. චීන ශිෂ්ටාචාර වැසියන්ගෙන් ලෝකයට ලැබුණු දායාද දෙකක් ලියන්න. (ලකුණු 04)
3. මිනිසා ගොවිතැනට යොමු වීම නිසා ඇති වූ සුවිශේෂී වෙනස්කම් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05)

1.පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද ලංකාවේ පළමු වැව නම් කරන්න. (ලකුණු 02)

2. අනුරාධපුර නගරය සැලසුම් සහගතව ඉදිරිපත් කිරීමේ දී ඊට එක්කළ අංග හතරක් නම් කරන්න. (ලකුණු 04)

3. අශෝක රජු හා දේවානම්පියතිස්ස රජතුමා අතර පැවති මිත්‍රත්වය නිසා ලංකාවට ලැබුණු දායාද පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

06)

1. "මෙසපොතේමියා" යන වචනයෙහි අදහස කුමක්ද? (ලකුණු 02)

2.මෙසපොතේමියානු සමාජය සමන්විත වූ ප්‍රධාන කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 04)

3.ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

For more past papers and exam resources,visit www.pastpaperszone.lk

**6 වසර- ඉතිහාසය - පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1) - 2 | 6) - 1 | 11) - 3 | 16) - 1 |
| 2) - 4 | 7) - 2 | 12) - 2 | 17) - 2 |
| 3) - 1 | 8) - 2 | 13) - 3 | 18) - 2 |
| 4) - 2 | 9) - 4 | 14) - 1 | 19) - 1 |
| 5) - 2 | 10) - 1 | 15) - 4 | 20) - 2 |

II කොටස

| A රූපය | B රූපය |
|---|---|
| 1) I. නෙෆටීටි රැජින | I. කාන්තා රූපයක් |
| II. අක්හෙනතන් | II. පුරාශිලා යුගය |
| III. ඊජිප්තුව | III. සත්ව ඇට කැබැල්ලක් |
| IV. පාරාවෝ | IV. චිත්‍ර ඇඳීම, සංගීතය, නැටුම් |

02)

1) පාසල් ලොග්පොත, සමරුඵලක/ සමරු සටහන්

2) පැරණි කාලයට අයත් භාණ්ඩ
ගොඩනැගිලි හා සුන්බුන්
මිනිස් ඇටසැකිලි
පැරණි රජමාළිගා/ බලකොටු

3) අතීත අත්දැකීම් තුලින් වර්තමානය වැඩ යහපත් කර ගැනීමට
අතීත මුතුන් මිත්තන් ලබාගත් ජයග්‍රහණ ගැන අවබෝධ කර ගැනීමට
අන් සංස්කෘතින්ට ගරු කිරීම
සමගියෙන් හා සහජීවනයෙන් යුතු සමාජයක් ගොඩනගා ගැනීමට

03)

1) අධික ශීතලට මුහුණ දීම/ ආහාර හිඟය

2) විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදිකිරීම
එළවළු වර්ග පිස ආහාරයට ගැනීම
ඉතා හොඳ දඩයක්කරුවෙකු වීම

3) කණ්ඩායම් ලෙස එළිමහනේ තැන් තැන්වල ජීවත් වීම
මලගිය නෑදැයින් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම
ගුරුගල් භාවිතයෙන් භාණ්ඩ හුවමාරුව ආරම්භ වීම
දඩයම හා තැන තැන ඇවිද ආහාර එකතු කිරීම

04)

1) තිරිඟු/ බාර්ලි/වී/කුරක්කන්

2) වෙඩිබෙහෙත්/මාලිමා යන්ත්‍රය/ කඩදාසි/ මුද්‍රණ යන්ත්‍රය

3) විවිධ ධාන්‍යවර්ග හඳුනා ගැනීම හා බෝකර ගැනීම.
පවුලේ සාමාජිකයන් සමඟ එකතැනක වාසය කිරීමට යොමු වීම.
නිවාස ඉදිකිරීම/ ගම්මාන බිහිවීම
ගොවිතැනට අවශ්‍ය උපකරණ තනා ගැනීම

05)

1) අභය වැව

2) නගරය වටා සීමා ලකුණු කිරීම
නගරයේ ආරක්ෂාවට දිය අගල් ඉදිකිරීම
ප්‍රධාන දිශා හතරට දොරටු 4 ක් නිර්මාණය කිරීම
නගරය ඇතුලත උද්‍යාන පොකුණු ආදි සුන්දර දෑ ඉදිකිරීම

3) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවීම
අනුරාධපුරයේ නගර සීමා ලකුණු කිරීම
ශ්‍රී ලංකාවේ මෙහෙණි සසුන ආරම්භ කිරීම

06)

1) ගංගා දෙකක් මැදිවන සේ පිහිටි රට

2) පූජකයින්
ඉහළ පන්තිවලට අයත් වැසියන්
පහළ පන්තිවලට අයත් වැසියන්
වහලුන්

3) දියුණු වාරිමාර්ග පද්ධතියක් නිපද වීම
පිරමීඩ
ඊජිප්තු චිත්‍රාක්ෂර
මමීකරණය

මෙම කරුණු වලින් දෙකක් පැහැදිලි කර ඇත්නම් ලකුණු දෙන්න.

For more past papers and exam resources,visit www.pastpaperszone.lk